ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**මාධ්‍ය නිවේදනය**

**<u>ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ 41 වන අධ්‍යක්ෂ මණ්ඩල හමුව නව දිල්ලි නුවරදී පැවැත්වේ</u>**

ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ (ISLF) 41 වන අධ්‍යක්ෂ මණ්ඩල හමුව 2026 අගෝස්තු 28 වන දින නවදිල්ලි නුවරදී පැවැත්විණ. මෙම හමුව ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතාගේ සහ ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මහිෂිනි කොලොන්නෙ මහත්මියගේ සම සභාපතිත්වයනේ පැවැත්විණ. පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වන තානාපති මෝහන් කුමාර්, තානාපති ප්‍රසාද් කාරියවසම් සහ අශෝක් මලික් යන මහත්වරු ද මෙම හමුවට සහභාගී වූහ.

2. අධ්‍යක්ෂ මණ්ඩලය දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතීන්වල ප්‍රගතිය සමාලෝචනය කළ අතර සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍ය, පාරිසරික, කෘෂිකාර්මික, කාන්තා අධ්‍යයන සහ පුහුණු ඇතුළු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් ලැබී තිබූ නව ව්‍යාපෘති යෝජනා රැසක් අනුමත කළහ. තරුණ මාධ්‍යවේදීන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතීන්; උපාධි අපේක්ෂක ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්; තේ කර්මාන්තය තුළ කාන්තා සවිබල ගැන්වීමේ ව්‍යාපෘතීන් සහ පරිසර හිතකාමී සනීපාරක්ෂක තුවා නිෂ්පාදනය; ග්‍රන්ථ පරිවර්තන සහ ප්‍රකාශන; නර්තන පුහුණු වැඩසටහන්; ඩිජිටල් සහ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමේ වැඩසටහන්; හඳුනාගත නොහැකි හේතු නිසා මතුවන නිදන්ගත වකුගඩු රෝග පිළිබඳ දැනුම හුවමාරු කරගැනීමේ වැඩසටහන්; කෘත්‍රිම සහ විකලාංග උපකරණ නිෂ්පාදන පිළිබඳ දැනුම හුවමාරු කරගැනීමේ වැඩසටහන් සහ සමුද්‍රීය කළමනාකරණය සහ මානසික යහපැවැත්ම පිළිබඳ අධ්‍යයන සහයෝගිතා යනාදිය ද අනුමත කළ ප්‍රධාන ව්‍යාපෘතීන් අතර වේ.

3. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම ආර්ථික, විද්‍යා, අධ්‍යාපනික, තාක්ෂණික සහ සංස්කෘතික සහයෝගීතාවය ඉහළ නැංවීම තුළින් ද්විපාර්ශ්වික සහයෝගීතාවය ශක්තිමත් කිරීමේ සහ දෙරට ජනතාව අතර සබඳතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1998 වසරේ දෙසැම්බර් 28 වන දින ඉන්දියානු සහ ශ්‍රී ලංකා රජයන් අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් පිහිටුවන ලදී. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම මේ දක්වා ශ්‍රී ලංකා රුපියල් මිලියන 200කට අධික වටිනාකමකින් යුත් ව්‍යාපෘති 600කට වැඩි ගණනකට සහය ලබා දී ඇති අතර ව්‍යාපෘතීන් 380කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නංවා ඇත.

***

**කොළඹ**

***2026* අගෝ*ස්තු* *29***